# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1739/18 — 2012 ජනවාරි 04 වැනි බදාදා - 2012.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

නිවේදනය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන හා වෙළඳ කටයුතු විෂය භාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් 2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් සඳහා රාජකාරී සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබාදීම සඳහා වන ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් වෙත රාජකාරී සඳහා නිවාස හා ජංගම දුරකථන බිල්පත් පියවීම වෙනුවෙන් වන වියදම් පිළිබඳ රීති මෙයින් පනවනු ලැබේ.

මෙම රීති බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කිරීමෙන් පසුව එකී අනුමැතිය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළවූ දින සිට බලාත්මක වන්නේය.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා<br>
මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,<br>
පළාත් පාලන පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති,<br>
මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන හා<br>
වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ජනවාරි මස 04 වැනි දින,<br>
කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,<br>
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

### රීති

මෙම රීති බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් වෙත රාජකාරී සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් සඳහා බිල්පත් පියවීම වෙනුවෙන් වන වියදම් පිළිබඳ රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන්ගේ රාජකාරී සඳහා නිවාස හා ජංගම දුරකථන බිල්පත් පියවීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් දැරිය හැකි උපරිමය රුපියල් දෙදහසකි (රු. 2,000/-)

01-469


1A - PG 001331— 395 (2012/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.